රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 06/2006 (XI)

මගේ අංකය: EST 5/1/41
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2014.07.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## වැටුප් පරිමාණයක උපරිමයට පැමිණි නිලධරයන්ට වැටුප් වර්ධක ගෙවීම

2007.01.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (III) හා 2008.06.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (V) සහ ශ්‍රේණි ක්‍රමයක් නොතිබීම නිසා ඊළඟ ශ්‍රේණියට උසස් වීම් නොලද සිය වැටුප් පරිමාණවල උපරිම පියවරට පත්ව ඇති ප්‍රාථමික ශ්‍රේණිවල නිලධරයන්ට ද 2010.12.31 දින දක්වා, ඔවුන්ට පෞද්ගලික වනසේ වැටුප් වර්ධක ලබා දීමට ඉඩකඩ සලසා ඇති 2011.08.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IX) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ප්‍රකාරව සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීම් පරිපාටිය/ උසස් කිරීම් පරිපාටිය සංශෝධනය නොවීම මත අතරමැද ශ්‍රේණිවල උපරිමයේ රැඳී සිටින නිලධරයන් සඳහා හා පැරණි සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීම් පරිපාටියේ ශ්‍රේණි ක්‍රමයක් නොමැති වීම මත ඊළඟ ශ්‍රේණියට උසස් වීම් නොලද නිලධරයන් සඳහා නව සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීමේ පරිපාටිය/ උසස් කිරීම් පරිපාටිය අනුමත වී අදාල ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන තුරු උපරිමයෙන් ඔබ්බට තවදුරටත් වැටුප් වර්ධක ගෙවීමට ඉහත සඳහන් චක්‍රලේඛ විධිවිධාන අනුව නොහැකිය.

03. එබැවින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ක්‍රියාත්මක වූ 2006.01.01 දින සිට නව සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීම් පරිපාටිය/ උසස් කිරීම් පරිපාටිය අනුමත වන දිනය දක්වා, අනෙකුත් සියලුම සුදුසුකම් සපුරා තිබියදීත් නව සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීම් පරිපාටිය / උසස් කිරීම් පරිපාටිය අනුමත නොවීමේ හේතුව මත උපරිමයේ රැඳී සිටින නිලධරයන් හා ශ්‍රේණි ක්‍රම නොමැති වීම මත ඊළඟ ශ්‍රේණියට උසස්වීමට නොහැකි වූ නිලධරයන් සඳහා ඔවුන්ට පෞද්ගලික වන සේ, අදාල ශ්‍රේණියේ උපරිම වැටුප් පියවරට එළඹුන දින සිට සේවා ව්‍යවස්ථාව හෝ බඳවා ගැනීම් පරිපාටිය/ උසස් කිරීම්

පරිපාටිය අනුමත වන දිනය දක්වා වැටුප් වර්ධක උපයා ගත්තේ නම්, එම වැටුප් වර්ධක ලබා දීමට, 2014.06.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත. ඒ අනුව නියමිත සුදුසුකම් සපුරා තිබිය දීත් උපරිමයේ රැඳී සිටීමේ හේතුව මත වැටුප් වර්ධක ගෙවීම නතර කර ඇති නිලධරයන්ට වැටුප් වර්ධක ලබා දීමට පියවර ගත යුතු ය.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය